**නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------**

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 එස්ආර්අයි (සීඕඑල්) දරන ණය පහසුකම් ගිවිසුමේ 4.02 (ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

**-----------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උපාය මාර්ගික නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ප්‍රමුඛ නාගරික සංවර්ධන ව්‍යාපෘතිවල ඉහල මට්ටමේ සූදානමක් ඇති කිරීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,090.98 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 5.74 ක් වන අතර ඉන් රු. මිලියන 883.88 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 4.65 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**-----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රු.2,909,686 ක් වූ දේපල පිරියත උපකරණ මූල්‍ය ප්‍රකාශනවලට අතුලත් කර නොතිබුණි. එසේම මෙම වත්කම්වලට අදාල රු.120,197 ක් වූ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනයන් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | දේපල පිරියත හා උපකරණවල අගය අඩුවෙන් දැක්වීම හා වර්ෂයේ නිවැරදි ක්ෂය වියදම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් නොවීම. | වර්ධක පරිපාලන පිරිවැය ගිණුම් තැබීමට උපචිත පදනම අඛණ්ඩව යොදාගන්නා ලදී. | දේපල පිරියත හා උපකරණවල තථ්‍ය අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. වත්කම් සඳහා වන ක්ෂය විදම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ උපකාර්යාල ස්ථාපිත කිරීම සඳහා බදු පදනම මත ලබාගත් නිවාස වෙනුවෙන් ගෙවා තිබුණු රු.800,000ක අත්තිකාරම් ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලැබිය යුතු අත්තිකාරම් අඩුවෙන් දැක්වීම. | අත්තිකාරම් ගෙවීම් වර්ධක පිරිවැය යටතේ දක්වා ඇති අතර ව්‍යාපෘතියේ වර්ධක පිරිවැය මුදල් පදනම යටතේ සලකා බලනු ලබයි. | පියවා නොමැති අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය**

| සංරචකය | කාර්යය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| තිරසාර නාගරික යටිතල පහසුකම් හඳුනා ගැනීම | සැලසුම් කිරීම, විස්තරාත්මක නිර්මාණකරණය සහ ප්‍රසම්පාදන, ප්‍රවාහන මාර්ග තදබදය, නාගරික සංවර්ධන | ව්‍යාපෘති පරිපාලන අත්පොත (ව්‍යා.ප.අ.) අනුව, උපදේශන සේවා, කටයුතු 2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතව | ව්‍යාපෘතියේ සැලසුම් කළ කාල පරාසය තුළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට | ප්‍රසම්පාදන කටයුතුවල පැවති දුර්වල කාර්යසාධනය | යෝජනා සඳහා ඉල්ලුම් කිරීම (යෝ.ඉ.කි) 2018 සැප්තැම්බර් මාසයේදී | උපදේශන සේවා ප්‍රසම්පාදනය කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| උසස් කිරීම්, පරිසර කළමනාකරණ සේවාවන් සඳහා වූ උපදේශක සේවා | තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 833 ක් වූ උපදේශන සේවාවන් 3 ක් 2019 මැයි 01 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, උපදේශන සේවා ගිවිසුම් මාස 4 ක් ප්‍රමාද වී අත්සන් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීම තවදුරටත් ප්‍රමාද වී තිබුණි. | නොහැකි වීමට ඉඩ තිබීම. | | ආරම්භ කර 2018 නොවැම්බර් මාසයේදී අවසන් කරන ලදී. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී උපදේශන සේවා වාර්තා 3 ක් භාරදී තිබුණද, වාර්තාවල තිබුණු දෝෂ හේතුවෙන් එම වාර්තාවන් ව්‍යාපෘතිය මඟින් අනුමත කර නොතිබුණි. මේ හේතුව නිසා ව්‍යාපෘතියේ කටයුතු සහ ප්‍රධාන ණය මුදල අනුමත කිරීම ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු සැලසුම්ගත කාල සීමාව තුළ නිම කිරීමට නොහැකි විය හැකිය. | ප්‍රාදේශීය සමායෝජන කමිටුව සහ අමාත්‍යාංශ සමායෝජන කමිටුවල ප්‍රමාද වීම් ඇති විය. | උපදේශකවරුන්ගේ වැඩ කටයුතු ඉටු කරවාගෙන ප්‍රමාදයන් වැලැක්වීම සඳහා උපදේශකවරුන්ගේ වැඩකටයුතු අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 3.3 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබාදී තිබුණු රු.මිලියන 838.88 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 4.65 ක මුදලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ | ව්‍යාපෘතියේ අරමුදල් සපයා ගැනීමේ වැඩපිළිවෙලට බලපෑමක් | ආසියානු සංවර්ධන බැංකුවෙන් අත්තිකාරම් මුදල් ලබා ගැනීම සඳහා මාස 6 කට පෙර පුරෝකථනයන් සිදුකළ | ව්‍යාපෘතියේ වැඩකටයුතු සැලසුම් කළ කාලය තුළ හා අයවැය ලේඛනයට අනුකූලව නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර 2019 දෙසැම්බර් 31 දිනට මාස 9 ක් ගත වූ පසුවද උපයෝජනය කර තිබුණෙන් එ.ජ.ඩොලර් මිලියන 0.32 කට සමාන රු.මිලියන 53.04 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක් පමණි. එසේම ව්‍යාපෘති කටයුතුවල පැවති දුර්වල ප්‍රගතිය හා ව්‍යාපෘතියෙහි දුර්වල මූල්‍ය පුරෝකතනය හේතුවෙන් රු.මිලියන 72.90 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 0.40 ක් උපයෝජනය කිරීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ රඳවා ගෙන තිබුණි. | සිදුවන අතර එය ව්‍යාපෘතියේ වැඩකටයුතුවල දුර්වල ප්‍රගතිය කෙරෙහි බලපෑමක් කළ හැකිය. | යුතු බැවින් බැංකුවේ රඳවාගෙන ඇති මුදල් මෙම හේතුව නිසා ඉහල අගයක් පෙන්නුම් කරනු ලබයි. |

### 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාල නිරීක්ෂණ

---------------------------------------------------

ව්‍යාපෘතියෙහි සමස්ථ අනුමත කාර්යමණ්ඩලය 28 කින් සමන්විත වන අතර මෙයින් ප්‍රධාන කළමනාකරණ තනතුරු 8 ක් එනම් ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු, ප්‍රසම්පාදන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් යනාදි තනතුරු 2019 දෙසැම්බර් 31 දින දක්වාම බඳවා ගැනීමකින් තොරව පුරප්පාඩුව පැවතුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමේ 24.1 වගන්තිය ප්‍රකාරව රු.මිලියන 544 ක් වූ උපදේශන සේවාවන් දෙකක කොන්ත්‍රාත් සඳහා වෘත්තීය වගකීම් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. එසේ වුවත්, මෙකී රක්ෂණ ආවරණය ලබා ගැනීමකින් තොරව රු.මිලියන 41.99 ක අත්තිකාරම් උපදේශකවරුන්ට ගෙවා තිබුණි. | මෙම තත්ත්වය කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් වේ. | අත්තිකාරම් ගෙවීම් සඳහා ව්‍යාපෘතියට පිළිගත හැකි අත්තිකාරම් බැඳුම්කරයක් ලබා ගැනීමෙන් පසුව අත්තිකාරම් ගෙවීම් සිදුකර ඇත. | උපදේශන කොන්ත්‍රාත් සඳහා ගිවිසුමෙහි සඳහන් මගපෙන්වීම් අනුගමනය කළ යුතුය. |